**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 26 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 91.71 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 81.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.20 ක් හෙවත් සියයට 11.12 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 76.11 | 68.49 | 7.62 | 10.01 |
| මූලධන | 15.60 | 13.02 | 2.58 | 16.54 |
| **එකතුව** | **91.71** | **81.51** | **10.20** | **11.12** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23701යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.98 | 3.29 | 2.98 | 3.24 | 30.00 | 15.16 |

## 2.3 විගණන නිරීක්ෂණය

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 23701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු.213,887 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 11 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.2 කාර්යසාධනය

රේඛීය අමාත්‍යාංශවල ව්‍යාපෘති හා වැඩසටහන් සැකසීමේදී ඒ සඳහා සහායවීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. අමාත්‍යාංශ විසින් ව්‍යාපෘති සකසා ඉදිරිපත් කිරීමේදී රටේ සෑම පළාතකටම ව්‍යාප්ත වන ලෙස ව්‍යාපෘති බෙදීයන අයුරින් සකස් කර රටේ සංවර්ධනය තුලනාත්මකව සිදුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සහාය ලබා දෙන බව සඳහන් කර තිබුණි. 2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයෙන් ව්‍යාපෘති ඇගයීම පිළිබඳ ලබාදුන් විස්තර අනුව ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති රටේ සෑම පළාතකටම ව්‍යාප්තවී නොතිබුණි.

3.3 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති යෝජනා පිළිබඳ ලිපිගොනු නියැදියක් පරීක්ෂා කිරිමේදී ව්‍යාපෘතියක් සඳහා විදේශ ආයතනයක් විසින් අරමුදල් සපයා දීමට ඉදිරිපත් වී තිබුණි. ඒ සඳහා ඉල්ලුම්පත් 2015 පෙබරවාරි 15 දිනට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණි. මේ සඳහා ඉදිරිපත් වී ඇති යෝජනාව පිළිබඳ වැඩිදුර විස්තර ඉල්ලා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයට 2015 මැයි 19 දින ලිපියක් දෙපාර්තමේන්තුව විසින් යවා තිබූ අතර, ඒ වන විට ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට දී තිබූ කාලය ඉකුත් වී තිබුණි. මේ නිසා එම ව්‍යාපෘතිය අදාළ විදේශාධාර ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට එක් එක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණු විවිධ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් ඇගයීම් කර තිබුණි. එම ව්‍යාපෘති ඇගයීමට ලක් කරන ලද හා එසේ නොකරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලේඛනගත කර නොතිබුණු බැවින් තැපැල් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශයේ 2015 වර්ෂයේ ඇගයීමට ලක් කරන ලද ව්‍යාපෘති 08 ක හා විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යාපෘති 02 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රවාහන අංශයේ 2015 වර්ෂය වෙනුවට 2016 වර්ෂයේ අනුමත කරන ලද ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබුණි.

3.4 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 42 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 28 | 12 | 16 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 27 | 02 |
| | **එකතුව** | **116** | **81** | **35** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ආ) අනුමත පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පවතින අතර ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු එම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පිහිටුවා ඇති සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානයේ පුස්තකාල සංවිධානය, බෙදාහැරීම්, විමසීම් හා විමර්ශණය හා අනෙකුත් සේවාවන් යන කාර්යයන් සාර්ථකව කරගෙන යාමට අනුමතවී ඇති පුස්තකාලයාධිපති තනතුර වෙනුවට ක්‍රමසම්පාදන සේවයේ

නිලධාරියෙකුගේ සේවය ලබාගැනීම ඵලදායී නොවනු ඇති බවත්, එය එකී නිලධාරියාගේ නිත්‍ය රාජකාරී කටයුතුවලට බාධාවක් වනු ඇති බවත් නිරීක්ෂණය විය. තවද පුස්තකාලයේ කටයුතුවල යම් යම් ගැටළු සහගත තත්ත්වයන් සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 30 දිනැති අංක TRE/D/NPD/2/15/03 දරන විගණන විමසුමෙන් පෙන්වා දී තිබුණු කරුණුවලට මෙවැනි තත්ත්වයන්ද හේතු විය හැකි බව වැඩිදුරටත් නිරික්ෂණය විය.

( ආ) දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ හා සන්නිවේදන, තාක්ෂණ හා පර්යේෂණ, විදුලිබල හා බලශක්ති, වරාය, නාවික හා ගුවන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට අදාළව පවතින ව්‍යාපෘති ඇගයීම සඳහා එකම ක්ෂේත්‍රයක නැතිනම් එකම සේවයක පළපුරුද්ද ලැබූ නිලධාරින් විසින් කටයුතු කිරිමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති සිවිල් ඉංජිනේරු තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ වන ව්‍යාපෘති යෝජනා ඇගයීම වඩාත් ඵලදායී වනු ඇති බව නිරීක්ෂණය විය.